සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## සිංහල - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පහත දක්වෙන උද්ධෘත පාඨ කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) "සැවැත් නුවර වසන එක් කුල දුවක් ගිහිගෙයි විසීමෙහි ආදීනව දැක පැවිදි ව එක් දවසක් සෙසු මෙහෙණින්නන් සමඟ බණ අසනු පිණිස ගොසින් අලංකෘත කොට සරහන ලද අස්නෙහි හිඳ බණ වදාරන්නා වූ බුදුරජාණනන් වහන්සේගේ අපමණ කුසලානුභාවයෙන් නිපන් උතුම් රූපසමෘද්ධියෙන් යුක්ත වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අසූඅනුව්‍යංජන කේතුමාලාලංකාරයෙන් අලංකෘත කොට සරහන ලද අස්නෙහි හිඳ විරාජමාන, ආත්මභාවය බලා සසර ඇවිදිනා වූ මා විසින් මේ උත්තමයාට පාදපරිචාරිකා ව විසූ කෙනෙක් ඇද්දෝ හෝ සිතුව."

(1) කවර තැනැත්තියක් කවුරුන් සමඟ බණ අසන්නට ගියේ ද?

(2) බුදුන්ගේ අපමණ කුසලානුභාවයන් නිසා ලත් ඵල කවරේ ද?

(3) 'සසර ඇවිදිනා වූ මා විසින් මේ උත්තමයාට පාදපරිචාරිකා ව විසූ කෙනෙක් ඇද්දෝ' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(4) ආදීනව, කේතුමාලාලංකාරයෙන්, පාදපරිචාරිකා, විරාජමාන යන පදවල ලිහිල් අර්ථ දක්වන්න.

(ලකුණු 04)

(ආ) "එකල හෙල්ලෝලි නම් ගම නායක චණ්ඩාලයාගේ දේවී නම් වූ දුවක් මල් පිණිස ගසට නැගී ඒ ගස නිල් අතුපතර අතුරෙහි දිලිහෙමින් නිල්වලාකුළෙක පහළ විදුලියක් සේ, මහ මේ ගබක් අතුරෙන් පෙනී ගිය පුන් සඳමඬලක් සේ තමාගේ අග්‍රප්‍රාප්ත වූ රූපශෝභාවෙන් දසදිග හොබවමින් හෝපලුමල් කඩා පැළඳ පල්ලවයක් අතින් ගෙන සිටියහ. එසේ සිටියා වූ සැඬොල් දුව දැක රාජකුමාරයෝ එකෙණෙහි උපන්නා වූ බලවත් ස්නේහ ඇති ව මහත් වූ ආශ්චර්යයට පැමිණ පූර්ව වාසනායෙන් ඈ කෙරෙහි උපන්නා වූ ප්‍රේම ධරාගත නො හී මුඛයෙන් වමාරන්නාක් හු මෙන් ඈ සමඟ කථා කරන්නාහු 'සොඳුර, තෝ කවරෙක් ද? කොයින් ආ කෙනෙක් ද? දෙව්ලොවින් බට දේවතා දුවක් ද? නොහොත් මනුෂ්‍ය ස්ත්‍රියක් ද? මේ ලෝකයෙහි තොප හා සමාන රූ ඇති අන් ස්ත්‍රියක් නොදුටුවිරිමි. තොපගේ තෙල මොළොක් වූ කොමළ පතුල් දෙක රත් පියුම් දෙකක් මෙන් බබළයි. "

(1) කුමරු නෙත ගැටෙන විට 'දේවී' නම් සැඬොල් දුව සිටි අයුරු මෙහි විස්තර කෙරෙන්නේ කෙසේ ද?

(2) ඇගේ මනහර රූ සපුව ගසෙහි අතුපතර බැබැළුනේ කෙසේ ද?

(3) දේවී කෙරේ හටගත් ප්‍රේමාන්විත හැඟීම් හමුවේ කුමරුගේ හැසිරීම කෙබඳු වීද?

(4) මේගබක්, හොබවමින්, පල්ලවයක්, නොදුටුවීරිමි යන පදවල අර්ථ ලියන්න. (ලකුණු 04)

(ඉ) "එසේ වී නම් නුඹ පමණකට කබලු පිසෙම් දැයි විචාළෝ ය. ඒ ගිවිසිලා ' මෙතැනදී පිසතොත් බොහෝ දෙන ආලය කෙරෙති. සාල් ඇරගන්නා කලත් නො කඩ සාල් හහැර නො ගෙන කඩසාල් හැරගෙන ඉදින්නකුත් කබල් පූකිරිත් හැරගෙන කිරිපැණිත් මීත් කබලුව කාගන්නා විචර මුත් වඩාත් හැර නොගෙන සත්මාල් මාලිගාවේ උඩුමාලට නැඟීලා පිසව. මමත් උඩුමාලේදී ම කම්' යි තමන්ගේ මසුරුකමෙයි තරම සුඟකුත් පසු ව හඟවන්ට නො තබා හඟවාපුය. උයිත් 'යහපතැ' යි ගිවිස කබලු කැවුමට වුවමනා දෙය ගෙන්වාගෙන මාලිගාවට නැඟෙන්නෝ කෙල්ලනුත් සිටුවාපියා සිටාණන් පමණක් හැරගත්හ. උයිත් මාලින් මාලේ අගුළු ලාගෙන සත් වන මාලට නැඟීලා සත් වන මාලේ කවුළුදොරත් පියාපුවොත් අඳුරු හෙයින් කවුළුදොර හැර තබාලා මහදොර අගුළු ලාගෙන කබලු කන්ට දැපී උන්හ."

(1) සිටාණන් උඩුමාලයට ගොස් කබලු කැවුම් පිසීමට විධාන කළේ ඇයි?

(2) කබලු සඳහා ගත යුතු හාල් කෙසේ වීද?

(3) කබලු පිසින තැන කෙසේ සුරක්ෂිත වීද?

(4) 'නො කඩ, 'ඉදින්නකුත්', 'සුඟකුත්', 'කවුළුදොර' යන පදවලට ලිහිල් අර්ථ දක්වන්න.

(ලකුණු 04)

(ඊ)

| | |
|---|---|
| නිති වැළ ලා ගෙන තුරු | හිමියනි |
| එන බමරුන් දැහැ පලු | පතතිනි |
| සිටි පිපි ලිය දැක කුල'ගන | මෙනි |
| සකි ලස නොව යව කොස | වඩමිනි |
| | |
| ලොබ කොට දුන් ගිරවුන් තුඩු | පබා |
| අසු කොට නොහැරම ඇතුළත | තබා |
| පිටත ට පැයුරු බිඹු වැළ | සුබා |
| තනෙතට පෙනෙනුය මහ වන | ගැබා |

(1) ගස් වැල් එතී ඇති ස්වරූපය කවියා දැක ඇත්තේ කොස් ද?

(2) 'සිටි පිපි ලිය දැක කුල'ගන මෙනි' යන්නෙහි කාව්‍යෝක්තිය දක්වන්න.

(3) ගිරා හොටයේ පැහැය ඇත්තේ කුමක ද?

(4) 'පැයුරු', 'තනෙතට', 'ලසනොව', 'පලුපතතිනි' යන පදවල අර්ථ දක්වන්න.

(ලකුණු 04)

The National e-learning Portal for The General Education

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය ලියන්න.

(1) 'මෙතෙක් කල් මා නොදැන කළ වරද ක්ෂමා කරව.'

(2) "ගමේ කට්ටිය සුමාන ගානක් හෙව්වලු. ඒත් හම්බ වෙලා නෑ."

(3) 'මොවුන් ඇර අනික් මනුෂ්‍ය ස්ත්‍රියක තබා දිව්‍ය ස්ත්‍රියක පාවා දුන ද මාගේ මනෝරථය පිරෙන්නේ නො වෙයි.'

(4) "නොලදහොත් මෙතරම් තරයක් ඇති තැනැත්තෝ නොයෙති. "

(5) "ඕවගෙ සමානකම් ඉබේ ම ඇතිවෙන්නත් පුළුවන්. ලීවල ගුල්ලො විදපු සිදුරුත් සමහර වෙලාවට අකුරු වාගේ පේන්නෙ."

(6) "වෙන රටවලත් මාළු කනවද උයන්නේ නැතිව?"

(ලකුණු 08)

(ඌ) පහත දැක්වෙන පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

අට වයස් නොදරුවා  
හැට පිරුණු කළු සමින්  
වැසුණු ඇට සැකිල්ලකි  
එහෙත් ඔහු සිනාසෙයි  
දත් පුරා සිනාසෙයි  
කට පුරා සිනාසෙයි  
ඇට පෙනෙන මුහුණ මත  
දෙකන තෙක් දික් ගැසුණු  
සිනාවෙන් ඔහු මුහුණ  
පුරුදු නැති සිත්තරෙකු  
නොංචි කෝලමට කැපූ  
සරිය වෙස් මුහුණකට  
වමතෙ පොල් කටුවෙ සිට  
කට ළඟට ගොස් වැටෙන  
ලී කැබැල්ලකි සුරත  
බට්ටෙක් මෙන් ඔරලෝසුවෙ  
ගණන් බලා තුන් විඩයක්  
උඩහට පහළට ගිය අත  
හිස් පොල් කටුවෙ එකවර නැවතිණ.  
'පොඩි ළමයෝ  
බත්  
ඉවර ද කාලා'  
පුදුමයෙන් මෙන් බලා මා දෙස  
දෙකන තෙක් දික් සිනා පාලා  
වීසි කොට පොල් කටුව කාණුවෙ  
පිස දමයි අත ඉරුණු සරමෙ

(ලකුණු 16)

The National e-learning Portal for The General Education

(02) 'ජාතක කතාකරු ස්ත්‍රියගේ චපලත්වය ද, විටෙක ශ්‍රේෂ්ඨත්වය ද හුවා දක්වමින් ස්ත්‍රී චරිතය වස්තු විෂය කර ගැන්මට බෙහෙවින් උත්සුක වී ඇත.' මෙය ඔබ උගත් ජාතක කතා ඇසුරු කර ගනිමින් සනිදර්ශනව පහදන්න.

(ලකුණු 15)

**නැතහොත්**

'සද්ධර්මරත්නාවලිය විශිෂ්ට බණ කතා ග්‍රන්ථ මූලාශ්‍රයක් වශයෙන් ගෞරවාදරයට පාත්‍රවන්නේ උපයුක්ත භාෂා රීතියෙහි චාතුර්ය ගුණය නිසා ය.' නිර්දිෂ්ට කතා දෙක උපයුක්ත කර ගෙන සනිදර්ශනව විමසන්න. (ලකුණු 15)

(03) 'ධර්මය අලංකාරාත්මක ව ඉදිරිපත් කරන සද්ධර්මාලංකාර කතුවරයා පාපයෙහි ආදීනවයත්, පුණ්‍ය ක්‍රියාවෙහි ආනිශංසයත් මැනවින් නිරූපණය කරන්නේ පුද්ගලයා ස්වයං පාලනයකට නැඹුරු කරවමිනි.' මෙම කරුණ සහේතුක ව සනාථ කරන්න. (ලකුණු 15)

(04) 'සංස්කෘත අලංකාර ශාස්ත්‍රයෙහි ආභාසය ලබමින් රචිත ගිරා සන්දේශය වූ කලී නොමසුරු ව භාවිත කරන ආලංකාරිකවලින් සපිරි සඳෙස් මිණකි.' නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(05) 'සමාජ යථාර්ථය ගැඹුරින් අවලෝකනය කිරීම ඇතැම් කෙටිකතාකරුවන්ගේ අරමුණ වී ඇත.' නිර්දිෂ්ට කෙටිකතා දෙකක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 15)

(06) 'මළගිය ඇත්තෝ' නවකතාව මගින් ප්‍රතිනිර්මාණය වන්නේ ද්වි සංස්කෘතික ඝට්ටනය නිසා අසරණත්වයට පත්වන පුද්ලයන් දෙදෙනෙකුගේ ශෝචනීය ඉරණම පිළිබඳ කථා පුවතකි.' සනිදර්ශනව විමසන්න. (ලකුණු 15)

(07) 'සංවේදී සියුම් අත්දැකීම් මගින් පාඨක හදවත් තුළ අනුවේදනීය හැඟීම් ජනනය කිරීමට නූතන කවීන් සමත් වී ඇත.' නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(08) 'රත්නාවලී නාට්‍යය වේදිකාව මත මවන පරිසර සෞන්දර්යය නාට්‍යයෙහි තේමාවට මනා ආලෝකයක් සපයයි.' උදාහරණ මඟින් මෙය පැහැදිලි කරන්න (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සිංහල - II

**12 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය ද, දෙවන කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු ලියන්න.
- පළමු කොටස හා දෙවන කොටස පිළිතුරු පත් සමග අමුණා භාරදෙන්න.

## I කොටස

- එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැලපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

(01) (1.1) අනම්‍ය ස්වර ලෙස සැලකෙන්නේ කවරක් ද?

(1) අ, උ, ඔ (2) ඇ, ඉ, එ (3) ඇ, එ, ඔ
(4) ඕ, ඌ, ඉ (5) අ, උ, ඉ (......)

(1.2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) සෙබළා. අග්‍රගන්‍ය, ද්විභාෂක, ප්‍රාමාණික
(2) පන්සිලු, අර්ණව, ප්‍රත්‍යවේක්ෂණ, ප්‍රස්තාව
(3) ප්‍රශස්ති, නිශ්ඵල, පහළ, ගැටලු
(4) චණ්ඩාල, තෙරණුවෝ, දක්ෂිණ, පනකුරු
(5) ආකර්ෂණ උලුවස්ස, භයංකාර විසංඥ (......)

(1.3) අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අම්මා, ඇටමැස්සා, එමා බෝවාරි, ඈනාකැරනිනා
(2) අමාවතුර, ගුත්තිලය, උමංදාව, සැළලිහිණි සංදේශය
(3) නිධානය, කලියුගය, යුගාන්තය, සෝමා
(4) කන්දක් සේ මා, ගුරුගීතය, වෙරි උයන, රාමායණය
(5) ගැහැනු ළමයි, යහළුයෙහෙළි, සතීගේ කතාව, ගොළුහදවත (......)

(1.4) පහත සඳහන් වරණ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යඤ්ජන අක්ෂරයකට මුලින්, උඩින්, යටින් හෝ අගින් පිලි නොයෙදේ.
(2) ප්‍රකෘති ව්‍යඤ්ජන අක්ෂරයක් හල් අකුරක් ලෙස නොපවතී.
(3) ප්‍රකෘති ව්‍යඤ්ජන අක්ෂරයකට 'අ' හැර වෙනත් ස්වරයක් එකතු වූ විට එය දක්වීමට පිල්ලම් යොදා ගැනේ.
(4) ව්‍යඤ්ජන අක්ෂරයකට 'අ' ස්වරය එක් වූ විට එය දක්වීමට පිල්ලම් යොදා ගැනේ.
(5) තොල් උත්පත්ති ස්ථානය කරගෙන උච්චාරණය වන්නේ කණ්ඨජ අක්ෂරය. (......)

(1.5) **විසර්ගය, අනුස්වාරය, යංශය, රකාරාංශය, රේඵය පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.**

(1) මනඃකල්පිත, ලංකාව, සෞඛ්‍යය, වික්‍රමය, කර්‍මය
(2) ලංකාව, සෞඛ්‍යය, මනඃකල්පිත, වික්‍රමය, කර්‍මය
(3) ලංකාව, මනඃකල්පිත, සෞඛ්‍යය, කර්‍මය, වික්‍රමය
(4) මනඃකල්පිත, ලංකාව, සෞඛ්‍යය, කර්‍මය, වික්‍රමය
(5) මනඃකල්පිත, ලංකාව, කර්‍මය, සෞඛ්‍යය, වික්‍රමය (......)

(1.6) **එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) ස්ථම්භ ප්‍රස්තාර, සප්ත කන්‍යා, ත්‍රිශූල අවිය, රන්වර්ණ
(2) ෂඩ් භාෂා, ඥාති සබඳකම්, පවාළ දම්, නිරර්ථක ප්‍රයත්නය
(3) දක්ෂිණ ශාඛා, සත්භාර්‍යා, පරිවේණ අධිපති, ලේඛක මඬුල්ල
(4) දුහුල්සළු, මිණිබරණ, සඳබිඹු, මිසදිටු
(5) සිරිකත, වත්පිළිවෙත්, ශෛලමුවා, සහස්වස (......)

(1.7) **තත්සම වචන පමණක් අන්තර්ගත වරණ කුමක් ද?**
(1) ලකුණ, රොස්, ශරීරය, ව්‍යවහාර
(2) ශෘංගාර, ෂඩ්ශාස්ත්‍ර, දෙසුම, සැත්කම්
(3) ශාස්ත්‍රෝද්ග්‍රහණ, ව්‍යංග්‍යාර්ථ, යෞවන, බුදු
(4) මෘදංග, බ්‍රාහ්මණ, මැණික්, මිහිරි
(5) දේශාභිමානී, දෛවෝපගත, දූරදර්ශී, ලංකේශ්වර (......)

(1.8) මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත්** පද පේළිය තෝරන්න.
(1) එහා මොබ, මෙපිට, ඔබ, මෙහා
(2) කම්මැළි අනලස්, කඩිසර, ක්‍රියාශීලී, කාර්යශූර
(3) පසුව කලින්, පූර්වයෙන්, පෙර, ප්‍රථමයෙන්
(4) කෘෂ තර, මහත, ස්ථූල, තරබාරු
(5) දොම්නස අමොද, තුස්, තිසුම්, නඳන් (......)

(1.9) මුලින් දැක්වෙන පදයට **සමානාර්ථ පදයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.
(1) සතුරු අමිතුරු, අරි, පිළිමල්, විරිදු
(2) සඳ කලානි, සසලේ, සේරුස්, හිමකර
(3) සිරිකත පියුම'ඹ, පියුම්කල්, වෙණුකල්, පියුම්නිල
(4) සිංහ කෙසර, මිගිඳු, මුවරඳ, සී
(5) නිරතුරු නිති, යොරයොර සතත, බොහෝවිට (......)

(1.10) **විශේෂණ, විභක්ති, අන්‍යාර්ථ, දකාරාර්ථ** යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.
(1) නෙතුපුල්, මුහුදුසුළං, රන්කම්, මව්පිය
(2) අත්පා, අටසිල්, එරුණුහස්, වනසත්තු
(3) ගල්හිත, පොල්තෙල්, බඹසුරනර, දුන්වත්
(4) මුවතඹර, හේන්මිරිස්, නන්සුරුබළන්, වගවලස්
(5) අතුඉති, බවදුක, දසබල, දසපනත (......)

(1.11) **කෘදන්ත පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
(1) වයන, පනින, සෙලවෙන, වසින (2) කිරුම්, මිනුම්, වෙවුලුම්, ගිගුරුම්
(3) වැටුණු, සෙවුණු, ගැයුණු, බේරුණු (4) වගුළ, වපුළ, මතුළ, දිදුළ
(5) දැගලිලි, කැසිලි, කැපිලි, නැටිලි (......)

(1.12) පහත සඳහන් වැකිවල **තද කළු අකුරින්** මුද්‍රිත පද අයත් **ක්‍රියා වර්ගය** පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
★ ඇදී ඇදී **එන්න** නදී රිදී තොටිල්ලේ
★ සරුංගලේ කොළ **අළවා** රැළි කෙරුවේ අපේ ළමයි
★ වැසි **වැටුණොත්** ඒ සොඳුරු මොහොත අඳුරු වේ සැණින්
★ මිණි මිණි පොදේ ළා අඳුරේ **තෙමී තෙමී** ගිය දා
★ මෙත් මල් **පිබිදේවා** සිත් තුළ මෙත් මල් පිබිදේවා

(1) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(2) ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
(3) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශීර්වාද ක්‍රියා
(4) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
(5) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශීර්වාද ක්‍රියා (......)

(1.13) **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** ඇති පද පේළිය තෝරන්න.

(1) සමහරු, හිතවත්තු, නැණවතුන්, මත්ස්‍යයෝ

(2) සිංහයින්, කිඹුලන්, තෝරු, මෝරුන්

(3) වළසෙකු, ළිහිණියෙකු, ඉබ්බෙක්, නරියෙක්

(4) මයිනෝ, සිත්තරු, සර්පයෝ, නළගනන්

(5) මහල්ලන්, යාචකයින්, ලෙඩ්ඩු, කැන්ගරුන් (......)

(1.14) **උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත** පද පේළිය තෝරන්න.

(1) අනුගමනය, අතිමහත්, අභිමුඛ, අබිරහස (2) අවමංගල, දුදන, විපක්ෂ, සුසිරිත්

(3) ප්‍රතිග්‍රහණ, නොදැමුණු, පිළිසරණ, උපනගර (4) උපත, පියන, සසල, සුලලිත

(5) අනලස්, අපරීක්ෂා, අනාදර, නිරායුධ (......)

(1.15) **සමාස පදයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.

(1) අත්පා, සියපත්, උණුවතුර සරාසඳ

(2) තලතෙල්, රහල්හිමි, බුදුපුද, වේපස්

(3) එළුමස්, බෙහෙත්බඩු, රියහිමි, පරපුටු

(4) අයුතු, ගවපල්, දුසිරිත්, ගත්කරු

(5) නයිවිස, රටවැසි, පාදපද්ම, ඇඳිරි (......)

(1.16) **එකම වර්ගයට අයත් නොවන සන්ධි පදයක් අන්තර්ත** වරණය තෝරන්න.

(1) වක්කඩ, අස්සන, දුප්පත්, අල්ලස්

(2) ගෙවුයන, නිරවුල්, දෙයාකාර, ගොවියා

(3) නෙළුම්මල්, වම්මුතු, නියංසාය, මුංඇට

(4) වැල්ලම්පිටිය, කොල්ලා, පත්තිරු, වැද්දා

(5) ගුණැති, ගිරග, සියැසින්, යටග (......)

(1.17) **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති** වරණය තෝරන්න.

(1) සෞන්දර්ය, ආදර්ශවත්, ජනතා, දිගැටි (2) පටන්, ලූ, සෙද, වහා

(3) උපැස්, පිළිතුරු, සදහම්, නිවත් (4) ලුණුදෙහි, අතිරස, දෙව්දත්, තිනෙත්

(5) පත්‍රිකා, සරණිවි, රාජාභිෂේක, මහෞෂධ (......)

(1.18) **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය සහිත** වරණය තෝරන්න.

(1) ගම්බද ක්‍රීඩිකාවෝ දැල් පන්දු ශූරතාව දිනා ගිනිති'යි සංවිධායකයෝ නොසිතූහ.

(2) සේවකයෝ කලින් ම වැඩබිමට පැමිණි ඇත.

(3) බල්ලන් බුරද්දී සොරුන් පැන ගියහ.

(4) වෘක්ෂලතාවෝ දිනකර පහසින් ප්‍රබෝධවත් වූහ.

(5) ඔබ යාචකයින්ට පිළිසරණ විය. (......)

(1.19) '**කැහැටු** බල්ලා **දිය'ගල** පැන ගොස් **අත්පා** වාරු නැතිව වැතිර ගත්තේ ය.' යන්නෙහි තද කළු අකුරින් මුද්‍රිත පද පිළිවෙළින් අයත් වන ව්‍යාකරණ අංග නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) සන්ධි, තද්ධිත හා සමාස පද ය.

(2) සමාස, සන්ධි හා තද්ධිත පද ය.

(3) තද්ධිත, සන්ධි හා සමාස පද ය.

(4) තද්ධිත, සමාස හා සන්ධි පද ය.

(5) සමාස, තද්ධිත හා සන්ධි පද ය. (......)

(1.20) වඩාත් ම **නිවැරදි පද බෙදීම** සහිත වාක්‍ය තෝරන්න.

(1) දරුවන්ට අවශ්‍යවන්නේ කායික පෝෂණයම නොවේ.

(2) ඔබ කළ යුත්තේ සවන්දීමයි, ඇතුළුකනකින් සවන් දීමයි.

(3) ප්‍රසාද ගුණයෙන් අනූන අධ්‍යාත්ම රීතියක් ප්‍රකට කරන 'පියසමර' කුමරතුඟුන්ගේ විශිෂ්ට කාව්‍යයකි.

(4) කවියෙහි මූලික තැනුම් ඒක කයවන් නේ භාෂාවයි.

(5) කවියෙන් ලබන චමත්කාරය එක් බඳුම විය යුතුයැයි කිසිවෙකට අණ කළ හැකිද? (......)

---

## II කොටස (ලකුණු 20)

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

(02) (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"දීර්ඝ ස්වර වෙනස් අකුරු ලෙස සිදත් සඟරාව ගණන් ගනී. දීර්ඝ ස්වර හුදුවත් ව්‍යඤ්ජනාරූඪවත් යෙදෙන පදයන් සාහිත්‍ය කෘතීන්ගෙන් ද එසේ ම පොදු බසින් ද උපුටා දක්වමින් එම සම්ප්‍රදාය නිදොස් බව ද පෙන්වයි. දීර්ඝ ස්වරයන් වර්ණ මාලාවට ඇතුළත් කරනු සඳහා යුක්තියක් දැක්වීම අවශ්‍යය යනු සිදත් සඟරා කතුවරයා තුළ ඇති වූ හැඟීම් නිසා ද, ඔහු විසින් උදාහරණයක් ලෙස යොදන ලද පදයන් නිසා ද, ඔහුගේ කාලයට පෙර පැවති ව්‍යාකරණ ග්‍රන්ථයන්හි දීර්ඝස්වරයන් අමුතු අකුරු ලෙස ඇතුළත් නො කළ බව හැඟී යයි. අට වන සියවසට පෙර පන්සිය වසරකට අධික කාල පරිච්ඡේදය තුළ ඇති වූ සිංහල සෙල්ලිපිවල දීර්ඝස්වර කිසිවිටෙකත් දක්නට නො ලැබේ. මේ ගැන කල්පනා කරත් ම සිදත්සඟරාකරුගේ අභිප්‍රාය වඩා විශද ලෙස වැටහෙයි. මෙහිදී අප සිත් යොමු වන සීගිරි ලේඛනයන්හි, 'ආ' කාරය හුදු ව ද ව්‍යඤ්ජනාරූඪ කොට ද ලියා ඇත. 'ඊ' හා 'ඌ' යන ස්වර හුදු ව නොයෙදෙයි. එහෙත් ව්‍යඤ්ජනාරූඪව යෙදී ඇති බව පෙනේ. 'එ' හා 'ඔ' යන ස්වර දෙක හුදු ව යෙදෙන කල දීර්ඝයන් ලෙස උච්චාරණය කරනු ලැබුවාක් මෙන් ව්‍යඤ්ජනාරූඪ වූ කල්හි ද දීර්ඝයන් සේ උච්චාරිත වූ බව පද්‍යයන්ගේ වෘත්තයෙන් පෙන්වයි. 'එ' 'ඔ' දෙදෙනාගේ හ්‍රස්වදීර්ඝ භේදය ලේඛනයෙන් නො දක්වයි. හුදු අනුස්වාරය භාවිත වූ බව පෙන්විය හැකි එක ම උදාහරණය සහිත පදයක් ද සීගිරි ගී අතරින් අපට ලැබේ. එසෙ වුවත් 'නැගි' 'හැග්නා' ආදිය වැනි පදයන්හි අර්ධානුනාසිකය්‍ය ඉතා සුලභ ය. දීර්ඝ ස්වරයන් සම්බන්ධයෙන් සිදත්සඟරාකරු යමක් කරන ලද ද 'එළු' අකාර මාලාවට අනුස්වාරය ඇතුළත් කරනු සඳහා ද එවැනි ම විශේෂ උනන්දුවක ඔහු නියැලී ගත් බව පෙනේ. ක්‍රි.පූ. තුන්වන සියවස පටන් අවුරුදු දහසක් පමණ කාලය තුළ ඇති වූ සිංහල සෙල්ලිපිවල අනුස්වාරය දක්නට නොලැබීම ඔහුගේ මේ උනන්දුවට හේතුව තහවුරු කරයි.

'සීගිරි ගී විවරණ'

(1) මේ ඡේදයෙහි එක් ස්වර වර්ගයක් හඳුන්වා ඇත්තේ 'දීර්ඝ' යනුවෙනි. අනෙක් ස්වර වර්ගය නම් කොට ඇත්තේ කෙසේ ද?

(2) දීර්ඝ ස්වර 'හුදුවත් ව්‍යඤ්ජනාරූඪවත්' යෙදෙන බව කීමෙන් මේ ලේඛකයා අදහස් කළේ කුමක් දැයි පැහැදිලි කරන්න.

(3) සිදත් සඟරාවට පෙර පැවති ව්‍යාකරණ ග්‍රන්ථයන්හි දීර්ඝ ස්වර අමුතු අකුරු ලෙස ඇතුළත් නුවූයේ කවර හෙයින් ද?

(4) සීගිරි ගීවල ව්‍යඤ්ජනාරූඪ ව පමණක් යෙදෙන දීර්ඝස්වර දෙකක් ගැන මෙහි කියැවේ. ඒ ස්වර දෙක මොනවා ද?

(5) මේ ඡේදයෙහි සඳහන් වන ආකාරයට පැරණි ම සිංහල සෙල්ලිපිවල ඇතුළත් නුවූ අක්ෂර දෙවර්ගයක් නම් කරන්න. (ලකුණු 2×5 = 10)

(ආ) පහත දක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වන සේ සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

දුම්රිය ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ අරමුණින්, 2010 දී ශ්‍රී ලං. දු. සේ. විසින් තම දුම්රිය ඇණිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබූ අතර, දුම්රිය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ද අඛණ්ඩ ව පවත්වාගෙන යන ලදී. දුම්රිය නියමිත වේලාවට සේවයේ යෙදවීම හා එහි විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා දුම්රිය එන්ජින් නඩත්තුව කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, එමඟින් දුම්රිය සේවාවන් සැපයීමේ ඉඩකඩ වැඩි දියුණු වේ. දුම්රිය එන්ජින් නඩත්තුව කඩිනම් කිරීමට පියවර ගැනීමත් සමග ශ්‍රී ලං. දු. සේ. ට තම දෛනික එන්ජින් 60 ක අවශ්‍යතාව ළඟා කරගත හැකි විය. ශ්‍රී ලං. දු. සේ. දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම සඳහා ඩීසල් බලවේග කට්ටල 20 ක් සහ දුම්රිය එන්ජින් 3 ක් අදියර දෙකක් යටතේ ආනයනය කිරීමට ද පියවර ගෙන ඇත. 2011 දී ගෙන්වීමට නියමිත ව තිබූ ඩීසල් බලවේග කට්ටල 13 අතුරින්, බලවේග කට්ටල දෙකක් විශේෂයෙන් ම සංචාරක අවශ්‍යතා වෙනුවෙන් භාවිත කිරීමට යෝග්‍ය සුඛෝපභෝගී බලවේග කට්ටල වන අතර, ඉතිරිය ප්‍රධාන මාර්ගයේ හා කැලණිවැලි මාර්ගයේ ධාවන කටයුතු ශක්තිමත් කිරීම සඳහා භාවිත කරනු ඇත. දුම්රිය ධාවනයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා රාගම සිට මීගමුව දක්වා සහ දකුණු කළුතර සිට පයාගල දක්වා ද්විත්ව මාර්ග ඉදිකිරීම වසර තුළ දී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මුහුදුබඩ දුම්රිය මාර්ගයේ වේග සීමාව පැ. කි. මී. 100 දක්වා ඉහළ නැංවීම සඳහා එම මාර්ග යළි සැකසීම මගින් කොළඹ සහ මාතර අතර ගමන් කාලය අඩුවේ. එහි මාතර හා ගාල්ල අතර කොටස ගොඩනැඟීමේ කටයුතු 2011 වසරේ පෙබරවාරි මස මැද වන විට අවසන් කරන ලදී. 2010 දී ඕමන්තෙයි සිට පලෙයි දක්වාත්, පලෙයි සිට කන්කසන්තුරේ දක්වාත්, මැදවච්චියේ සිට මඩු දක්වාත් සහ මඩු සිට තලෙයිමන්නාරම දක්වාත් දුම්රිය මාර්ගය නැවත ගොඩනැඟීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් පිරිනමන ලදී. (ලකුණු 15)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 350 අතර වන සේ ව්‍යාකරණානුකූල ව විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(1) අපේ ජාතික උරුමයන් පිළිබඳ ගවේෂණය හා සංරක්ෂණය.

(2) පරිගණක තාක්ෂණයේ අවභාවිතය නිසා ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල.

(3) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය හා බලශක්ති අර්බුදය.

(4) කුණුකසල හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පවත්නා අවිධිමත්භාවය නිසා ඇති වන පරිසර දූෂණය.

(5) වර්තමාන ගීත කලාවේ ගමන්මඟ. (ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල <u>සදොස් තැන් ඇතොත් නිදොස් කොට</u> ලියන්න.

(1) අයෙකු විනෝදාංශයක් ලෙස ගුවන් විදුලියට සවන් දෙති.

(2) නුඹ ද, මම ද ඇය වෙත දැඩි ආදරයක් දක්වන්නෙහි.

(3) කම්කරුවෝ මහා මාර්ගය පිළිසකර කරද්දී ඇතැම් රියැදුරෝ එහි වාහන වේගයෙන් පදවති.

(4) තමන් දෙන දන් භික්ෂුහු පිළිගනිති'යි රජු සිතුවේ ය.

(5) දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙක් වන්නේ කෙසේ ද? (ලකුණු 05)

(ආ) පහත සඳහන් <u>වාක්‍ය කර්මකාරකයට</u> හරවන්න.

(1) අපි නවක ශිෂ්‍යාවන් සිදරයෙන් පිළිගතිමු.

(2) මහිලාවෝ පුරුෂාධිපත්‍යයට එරෙහිව උද්ඝෝෂණ කළෝ ය.

(3) චීන ජාතිකයෝ විවිධ වර්ණවලින් යුත් සරුංගල අහසේ යවති.

(4) කාන්තාවෝ ස්වකීය දරුවන්ට කිරි ආහාර දුන්හ.

(5) ප්‍රවීණ නිළියක් නවක නිළියකට ආශීර්වාද කළා ය. (ලකුණු 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(1) (ගුරුවරු / ගුරුවරුන්) ........................................... බුහුමන් ලබන සේ හැසිරිය යුතු ය.

(2) පයින් (යන්නන්/ යන්නෝ)......................................................... මාර්ග නීති ආරක්ෂා කළ යුත්තෝ ය.

(3) (සරච්චන්ද්‍රයෝ / සරච්චන්ද්‍රයන්) ................................................ වේදිකා නාට්‍ය කලාව නව මං පෙතකට යොමු කළහ.

(4) බොහෝ ප්‍රවීණ ගීත රචකයෝ (සංගීතඥයයින් / සංගීතඥයෝ) ............................................... ද වෙති.

(5) පාලකයන් යෙහෙන් රට පාලනය කළහොත් (රටවැසියෝ / රටවැසියන්) .............................. ඔවුන් යළි මැති සබයට යවනු ඇත. (ලකුණු 05)

(05 × 03 = 15)

(05) (අ) **පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.**

(1) සිංහල පද්‍ය සාහිත්‍යයට **අනභිභවනීය** මෙහෙයක් කළ කුමරතුඟුවෝ හෙළයේ මහා පඬිරුවන වූහ.

(2) ජයසිරිමා බෝ මැඩ දී බුදුහු 'අග්ගෝ හමස්මි..........' යන්නෙන් සිය **උදානය** වදාළ සේක.

(3) පුරාණ ධර්මකථිකයෝ සිය දේශනයන්හිදී **පෙතිකඩ** ආදියද භාවිත කළහ.

(ලකුණු 03)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු <u>තනිපද ලියන්න.</u>

(1) අනුන්ගේ කීර්තිය වර්ණනා කරන්නා

(2) නගරයෙන් මඳක් දුරින් පිහිටි ගම

(3) ඔටුනු පැළඳවීමේ උත්සවය (ලකුණු 03)

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය** වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(1) ..................................................... ලැබීමෙන් කලා නිර්මාණයක ශ්‍රේෂ්ඨත්වයට හානියක් සිදු නො විය හැකි ය.

(2) සීගිරි පද්‍යයන්හි ප්‍රකට ලක්ෂණයක් නම් විනීත බව හා ....................................................... යි.

(3) ජාතක පොතෙහි බෙහෙවින් දක්නට ලැබෙනුයේ .................................. මුල් තැන දී රචිත කතා ය.

(4) කවියා සියුම් නිරීක්ෂණ ශක්තියෙන් හා ....................................................අවදිවුණු හදවතක් ඇත්තෙක් විය යුතු ය.

(5) නළුවා නිරූපණය කරන ........................................................ ඔහු සැබැවින් ම විඳිය යුතු බව කොන්ස්ටන්ටයින් ස්ටැනිස්ලාවුස්කි නම් රුසියානු නාට්‍යාචාර්යවරයාගේ මතයයි.

(6) පද්‍ය රචනය සම්බන්ධයෙන් ලියැවුණු, අද ........................................................ වන පැරණි ම කෘතිය වූ කලී සියබස්ලකර වේ.

( යථාර්ථයට / විද්‍යමාන / සංයමය / ආභාසය / පරිකල්පනයෙන් / මනෝභාවය )

(ලකුණු 03)

(ඊ) **තද කළු අකුරින්** දක්වා ඇති <u>**බහු අර්ථ පද යොදා වෙනත් අරුතක් දෙන ලෙස**</u> වාක්‍ය බැගින් තනන්න.

(1) ලෝ දහමින් වැදෙනා රළු පහරින් **ගත** සිත රිදෙනා කල නිතියෙන්.

(2) මලකින් මලකට ගොස් පැණි බොන්න ද මා **හිමි** බමරුනි ඔබ සැරසෙන්නේ

(3) මා වැනි බිලින්දා **වර** වර ළඟට කැන්දා.

(4) අනුන් ලියන් දැක තම ලියට **තල** තලා.

(5) **නා** මල් පිපිලා මේ වැව් ඉවුරේ.

(6) පසොළොස්වක **සඳ** පායනු වැන්නේ (ලකුණු 06)

(ලකුණු 3 + 3 + 3 + 6 = 15)

(06) **තද කළු අකුරින්** දක්වා ඇති පද **කුමන ව්‍යාකරණ අංගයකට** අයත් දැයි දක්වන්න.

(1) රත්තරං නෙත් දෙකින් සලා **සිහිල්** පවන් ජීවිතේ ළසෝ තැවුල් නිවන්න රත්තරං.

(2) උදේ **පටන්** වකුටු කොන්ද දිග හැරපල්ලා.

(3) නෙත **නිලුපුල්** වත රතුපුල් කොඳ කැකුළු **සිනාමල්**.

(4) **මේ මහකන්ද** බැලුවා හොරැහින් ම'දෙස.

(5) සබඳ අපි කඳු නොවෙමු **උනුන්** පරයා නැඟෙන, **සුනිල** දිය දහර වෙමු එක ම ගඟකට **වැටෙන**. (ලකුණු 3 × 5 = 15)

(07) (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන **ප්‍රස්තාව පිරුළ** ලියන්න.

(1) උද්ඝෝෂණයේ තරමට ප්‍රතිඵල නොලැබුණු බව

(2) ඉතා කලාතුරකින් යමක් සිදුවීම.

(3) උදව්වක් කර යමක් බලාපොරොත්තු වීම.

(4) පලිගත නොහැකි නිසා පිළිගැනීම.

(5) යම් ඵලයක් ඇති වන්නේ කිසියම් හේතුවක් උඩ බව.

(6) කාටත් වරදින බව. (ලකුණු 03)

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වනසේ** වාක්‍යවල යොදන්න.

| | | | |
|---|---|---|---|
| (1) | දිවෙන් දිව ගාගෙන | (4) | ගොළුබෙලි ගමන |
| (2) | පල්ලමක් අහුවුණා | (5) | මර ඇඳේ |
| (3) | පොරකටු ගෙවිලා | (6) | අත දෙනවා (ලකුණු 03) |

The National e-learning Portal for The General Education

(ඉ) පහත දී ඇති යුගල පද සෑදී ඇති රටාව කුමක්දැයි දක්වන්න.

(1) කෙළිසෙල්ලම් (4) සද්දබද්ද

(2) දුකසැප (5) බඩුමුට්ටු

(3) ලට්ටලොට්ට (6) කාබී (ලකුණු 03)

(ඊ) පහත සඳහන් ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

(1) අඳුරුකුක්කා (4) දෑවා

(2) කුයිල (5) පොල්ඹයනවා

(3) පුක්ගැටයා (6) ගුහාලය (ලකුණු 03)

(උ) පහත දී ඇති ප්‍රාස්තවික ව්‍යවහාරයන්ට දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අර්ථ ලියන්න.

(1) දෙහීය (4) ඉඟුරු

(2) කිරිකෝඩු (5) මීරම

(3) කොට්ටෝරුවා (6) මයක්කම (ලකුණු 03)

(03 × 05 = 15)

(08) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පුරාතනසිංහලගද්‍යසාහිත්‍යයේමූලාරම්භයසනිටුහන්කෙරෙන්නේක්‍රි.පූ.3වනසියවසේදීමිහිඳුමහරහතන්වහන්සේවිසින්මෙරටටහඳුන්වාදෙනලදබෞද්ධදේශනාඇසුරෙනි.එතුමෝප්බණදහමමාගධී(පාලි)බසින්ගෙනෙනලදඅතරමෙරටජනයාඅතරටමුදාහළේදේශීයභාෂාවෙන්හෙවත්සිංහලභාෂාවෙනිඑසේදේශීයභාෂාවන්ලදබණදහමහෙළටුවානමින්සිංහලයෙන්මපැවතආවේයනැවතප්හෙළටුවා5වනසියවසේදීපාලිඅටුවාචාරීන්අතින්පාලිබසටනැගෙයිසද්ධර්මරත්නාවලියටමුල්වනපාලිධම්මපදට්ඨකතාවත්පන්සියපනස්ජාතකපොතටමුල්වනපාලිජාතකට්ඨකතාවත්බිහිවන්නේඑලෙසිනි.මෙහිඑනකතාපොදුමහාජනකායඅතරබෙහෙවින්පැතිරගොස්ජනප්‍රියත්වයෙන්ඉහළමතැනලබාගත්තේය

(1) ඉහත ඡේදය ශාස්ත්‍රීය යැයි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව පද බෙදා, විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න. (ලකුණු 07)

(2) යංශය සහිත පදයක් සහ මහප්‍රාණ අක්ෂරයක් යෙදෙන පදයක් ඡේදයෙන් උපුටා ලියන්න.

(ලකුණු 02)

(3) ඡේදයේ සඳහන් රකාරාංශය යෙදෙන පදයක් සහ සඤ්ඤක අක්ෂරයක් යෙදෙන පදයක් උපුටා ලියන්න. (ලකුණු 02)

(4) 'ජනප්‍රියත්වයෙන්' යන්නෙහි ඇතුළත් පිල්ලම් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(5) රකාරාංශය සහ රේඵය එකම වචනයක අන්තර්ගත වූ ඔබ දන්නා වෙනත් පද දෙකක් ලියන්න. (ලකුණු 02)

(ලකුණු 15 යි.)